**2018.08.20 වන දින උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගත් රැකියා විරහිත උපාධිධාරීන් සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියට පත් කිරීම සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණිය සහ 2 පන්තිය II ශ්‍රේණියට පත් කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2020.03.17 දින සිට මේ දක්වා මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළ කරන ලද සියලු නිවේදන /දැනුම්දීම් ඔබගේ පහසුව පිණිස මෙහි පහත පළ කරමි.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**2020.03.17**

**උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස පත්වීම් ලබා වසරක පුහුණුව සම්පූර්ණ කිරීම මත සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියට පත් කරන ලද නිලධාරීන් වෙත සිදු කෙරන විශේෂ නිවේදනය**

2018.08.20 දිනැතිව උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස පත්වීම් ලබා වසරක පුහුණුව සම්පූර්ණ කිරීම මත සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියට පත් කරන ලද සියලු ම නිලධාරීන් මේ වන විට සේවා ස්ථානවලට අනුයුක්ත කර ඇත.

02. එසේ සේවා ස්ථානවලට අනුයුක්ත කරන ලද නිලධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් පෞද්ගලික දුෂ්කරතා මත සේවා ස්ථාන සංශෝධනය සම්බන්ධ ඉල්ලීම් ඉදිරිපත් කරන ලද අතර අභ්‍යාසලාභී පුහුණුව සඳහා නිලධාරියා අනුයුක්තව සිටි සේවා ස්ථානයට ම අනුයුක්ත කරන ලෙස ආයතන ප්‍රධානීන් විසින් සිදු කළ ඉල්ලීම් ද ඒ අතර විය.

03. එම අභියාචනා සියල්ල සලකා බලන ලද අතර පවතින පුරප්පාඩු ද සැලකිල්ලට ගත් විට සේවා ස්ථාන සංශෝධන සිදු කළ නිලධාරීන්ගේ නාමලේඛනය පහත පළ කරනු ලැබේ.
(සැලකිය යුතුයි: මෙම සේවා ස්ථාන සංශෝධනය වලංගු වන්නේ අදාළ නිලධාරීන් මෙතෙක් පත්වීම් ලිපිය මගින් අනුයුක්ත කර ඇති සේවා ස්ථානවල රාජකාරි භාරගෙන නොමැතිනම් පමණි.)

04. විශේෂයෙන්ම කෑගල්ල, කුරුණෑගල, ගාල්ල, මාතර, හම්බන්තොට, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, වවුනියාව, මුලතිව් සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල පැවති අවම පුරප්පාඩු ප්‍රමාණය හේතුවෙන් එම ප්‍රදේශවල පිහිටි දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලෙස සිදුකළ බොහෝ ඉල්ලීම් ඉටු කිරීම අපහසු වූ බව කාරුණිකව දැනුම් දෙමි.

05. කෙසේ වෙතත් ඉහත දිස්ත්‍රික්කවලින් නැවතත් යාවත්කාලීන කරන ලද පුරප්පාඩු වාර්තා කැඳවීමට කටයුතු කරන අතර එම වාර්තා අනුව තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම් පමණක් තවදුරටත් ඉදිරිපත් වී ඇති අභියාචනා සම්බන්ධව සහනයක් ලබා දීමට හැකි වනු ඇත.

06. මා විසින් නිකුත් කරන ලද පත්වීම් ලිපියේ සඳහන් කරන ලද **2020.03.16** දිනට රාජකාරි භාරගත යුතු බවට වන කොන්දේසියට අනුව කටයුතු කිරීම මේ වන විට කොරෝනා වයිරස ව්‍යාප්තිය සම්බන්ධව උද්ගතව ඇති අයහපත් වාතාවරණය සැලකිල්ලට ගෙන රජය විසින් විශේෂ නිවාඩු ප්‍රකාශයට පත් කිරීමත් සමග අපහසු වන බව පෙනී යන බැවින් ඒ සඳහා සුදුසු සහන කාලයක් ලබා දෙනු ලැබේ. ඒ අනුව ප්‍රකාශයට පත් කර ඇති නිවාඩු කාලසීමාව අවසන් වූ වහාම අනුයුක්ත කරන ලද සේවා ස්ථානවලට වාර්තා කරන ලෙස දන්වා සිටිනු ලැබේ.

07. ඒ අනුව මෙම කරුණ සම්බන්ධයෙන් විමසීම් සිදු කිරීම සඳහා මෙම අමාත්‍යාංශය වෙත පැමිණීමෙන් වළකින ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**සේවා ස්ථාන සංශෝධන ලිපි ලබා දීම:**

**දැනට සේවා ස්ථාන සංශෝධන සිදුකර ඇති නිලධාරීන්ගේ ලිපි සූදානම්ව පවතින අතර කොරෝනා වයිරස ව්‍යාප්තිය හේතුවෙන් ඇති වී ඇති තත්ත්වය පහව ගිය පසු එම ලිපි ඔබ වෙත ලබා දීම සඳහා දිනයක් තීරණය කර ඒ සම්බන්ධව ඉදිරියේ දී දැනුවත් කිරීමට කටයුතු කරන බව කරුණාවෙන් සලකන්න.**

එස්. ආලෝක බණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

| මගේ අංකය / எனது இல / My No | R/පොදු/1 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2020.03.27 |
|---|---|---|---|---|---|

අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**වාර්ෂික ස්ථාන මාරු හෝ සාමාන්‍ය ස්ථාන මාරු හෝ ලබා 2020 මාර්තු මාසය තුළ නව සේවා ස්ථානවලට වාර්තා කරන ලද නිලධාරින්ට සහ 2018.08.20 දින සංවර්ධන නිලධාරි සේවයේ පත්වීම් ලබා වසරක අභ්‍යාසලාභී පුහුණුව අවසන් කර ඇති උපාධිධාරීන්ට සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ සහ 2 පන්තියේ II ශ්‍රේණියේ නවක පත්වීම්ලාභී (2020.03.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලද) නිලධාරින්ට වැටුප් ගෙවීම**

රටේ දැනට පවත්නා තත්ත්වය ද සැලකිල්ලට ගෙන පහත සඳහන් නිලධාරි කාණ්ඩවලට වැටුප් ගෙවීම සම්බන්ධව අවධානය යොමු කරන ලදී.

1. වාර්ෂික ස්ථාන මාරු හෝ සාමාන්‍ය ස්ථාන මාරු හෝ ලබා 2020 මාර්තු මාසයේ නව සේවා ස්ථානවලට වාර්තා කරන ලද/ වාර්තා කිරීම සඳහා පූර්ව සේවා ස්ථානයෙන් මුදා හරින ලද නමුත් මෙතෙක් තම නියමිත වැටුප නොලබන නිලධාරින්
2. 2018.08.20 දින උපාධිධාරී අභ්‍යාසලාභී ලෙස පත්වීම් ලබා වසරක පුහුණුව අවසන් කර විධිමත් පත්වීම් ලබා දී ඇති, නමුත් 2020.03.16 දින වන විට නව සේවා ස්ථානයේ රාජකාරී භාර නොගත් නිලධාරින් සහ 2020.03.16 වන දිනට පෙර රාජකාරී භාර ගත් නමුත් මේ වන විටත් වැටුප් ලබා නොමැති නිලධාරින්
3. 2018.08.20 දින සිට උපාධිධාරී අභ්‍යාසලාභී ලෙස පත්වීම් ලබා වසරක පුහුණුව සම්පූර්ණ කිරීම මත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ පසු සම්මුඛ පරීක්ෂණයේදී අනාවරණය වූ යම් යම් කරුණු හේතුවෙන් විධිමත් පත්වීම් ලබා නොදී රඳවා ගත් නිලධාරින් සහ 2020.02.27 දින රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ දී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරින්
4. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණිය සඳහා සහ 2 පන්තියේ II ශ්‍රේණිය සඳහා 2020.03.16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කර ඇති, එසේ පත් කරන අවස්ථාව වන විටත් රාජ්‍ය සේවයේ යම් යම් තනතුරුවල සේවය කරන නිලධාරින් සහ ඉහත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ තනතුරු භාර ගැනීම සඳහා මේ වන විටත් මුදා හැර ඇති නිලධාරින්

02. ඉහත 1,2,3 සහ 4 හි සඳහන් නිලධාරි කාණ්ඩ සියල්ලට මාර්තු සහ අප්‍රේල් මාසවල අභ්‍යාසලාභී දීමනාව හෝ වැටුප ඉහත නිලධාරි කාණ්ඩ මෙතෙක් සේවය කළ හෝ අභ්‍යාසලාභී පුහුණුව ලැබූ ස්ථානයෙන්ම ගෙවීමේ කටයුතු සිදු කරන මෙන් කාරුණික දන්වා සිටිමි.

03. නිලධාරින් විධිමත් පරිදි රාජකාරී කටයුතු භාර ගැනීමෙන් අනතුරුව සිය පූර්ව සේවා ස්ථානයෙන් ලබා ගත් වැටුප් විස්තර නව සේවා ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු අතර එහිදී අධි ගෙවීමක් සිදු වී ඇති බව අනාවරණය වුවහොත් නිලධාරියාගෙන් එම මුදල අය කර ගැනීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතු වේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකතන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: info@pubad.gov.lk
ලිපිනය / முகவரி / Address: නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. / சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை. / Independence Square, Colombo 07, Sri Lanka.
වෙබ් අඩවිය/ வெப்தளம் /Website: www.pubad.gov.lk

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

இணைந்த சேவைகள் பிரிவு
சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.

COMBINED SERVICES DIVISION
*Independence Square, Colombo 07, Sri Lanka*

දුරකථනය / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணைத்தளம்: www.pubad.gov.lk / Web Site

මගේ අංකය / எனது இல / My No: R/DO/PER.APP/2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.04.20

**<u>ඒකාබද්ධ සේවයට අයත් නවක පත්වීම්ලාභී නිලධාරීන් රාජකාරි භාර ගැනීම</u>**

i **<u>ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණිය සහ 2 පන්තිය II ශ්‍රේණිය - පත්වීම් දිනය 2020.03.16</u>**

ii **<u>සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණිය (2018 වසරේ බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන්) – පත්වීම් භාර ගැනීමේ අවසාන දිනය 2020.03.16</u>**

2020.03.16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මා විසින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණිය සහ 2 පන්තිය II ශ්‍රේණියට පත් කළ නිලධාරීන් සහ 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියට පත් කරන ලද නිලධාරීන් බහුතරයකට දැනට රට තුළ උද්ගතව ඇති තත්ත්වය හේතුවෙන් මෙතෙක් රාජකාරි භාර ගැනීමට නොහැකි වී ඇත. එසේම දිස්ත්‍රික්ක බොහෝමයක ඇඳිරි නීති විධිවිධාන ලිහිල් කළ ද රාජ්‍ය ආයතන සඳහා නිලධාරීන් කැඳවීමට හැකි වන්නේ ජනාධිපති ලේකම්ගේ PS/GPA/චක්‍ර ලේඛ/20/2020 සහ 2020.04.18 දිනැති ලිපිය මගින් ලද උපදෙස් අනුව සීමිත ප්‍රමාණයක් පමණි.

02. එබැවින් ආයතන ප්‍රධානීන් වෙතින් විශේෂ කැඳවීමක් නොලදහොත් ඉහත රාජකාරි භාර නොගත් නිලධාරීන් මේ අවස්ථාවේ දී රාජකාරි භාර ගැනීමට කටයුතු නොකරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. එසේම රාජකාරි භාර ගැනීම සඳහා ඉහත නිලධාරීන්ට ලබා දෙන කාලය **2020.05.04** දින දක්වා දීර්ඝ කරන බව ද දන්වා සිටිමි.

03. ඒ අනුව දැනට රජය විසින් පනවා ඇති පුද්ගල සංචරණ සීමා කිරීම් සහ රාජ්‍ය ආයතනවල අත්‍යාවශ්‍ය සේවා පවත්වා ගැනීමට පමණක් සීමා වන පරිදි පනවා ඇති විධිවිධාන වලට බාධා වන පරිදි සේවා ස්ථාන සංශෝධන ඉල්ලීම් හෝ මේ සම්බන්ධ වෙනත් ලිඛිත ඉල්ලීම් රැගෙන මෙම අමාත්‍යාංශය වෙත පැමිණීමෙන් වළකින ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

04. නවක පත්වීම්ලාභී සංවර්ධන නිලධාරීන්ගේ ඉල්ලීම් මත සේවා ස්ථාන සංශෝධන සිදු කරන ලද අතර එම නිලධාරීන්ගේ නාමලේඛනය 2020.03.17 දිනැතිව අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළ කරන ලදී. ඒ අතුරින් මෙතෙක් සංශෝධන ලිපි ලබාගැනීමට නොහැකි වූ නිලධාරීන්ගේ ලිපි 2020.05.04 දිනට පෙර ලැබෙන සේ තැපැල් මගින් එවීමට කටයුතු කරන බව ද සැලකුව මැනවි. මේ වන විට පත්වීම් ලිපිය මගින් අනුයුක්ත කළ සේවා ස්ථානවල රාජකාරි භාර ගත් යම් නිලධාරියකු වෙත සේවා ස්ථාන සංශෝධන ලිපියක් නිකුත් වී ඇත්නම් එම ලිපිය බල රහිත වන අතර එම නිලධාරීන් සාමාන්‍ය ස්ථාන මාරු ක්‍රමවේදය අනුගමනය කරමින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා ස්ථාන මාරුවක් අයැදුම් කළ යුතු වේ.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

இணைந்த சேவைகள் பிரிவு
சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.

COMBINED SERVICES DIVISION
*Independence Square, Colombo 07, Sri Lanka*

දුරකථනය / தொலைபேசி / Telephone: **(94) 011- 2694560**
ෆැක්ස් / தொலைநகல் / Fax: **(94) 011- 2692254**
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: **dgcs@pubad.gov.lk**
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: **www.pubad.gov.lk**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: R/DO/PER.APP/2020 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2020.04.29 |

**ඒකාබද්ධ සේවයට අයත් නවක පත්වීම්ලාභී නිලධාරීන් රාජකාරි භාර ගැනීම**

i **ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණිය සහ 2 පන්තිය II ශ්‍රේණිය - පත්වීම් දිනය 2020.03.16**

ii **සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණිය (2018 වසරේ බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන්) – පත්වීම් භාර ගැනීමේ අවසාන දිනය 2020.03.16**

උක්ත කරුණ සම්බන්ධ මගේ සමාංක සහ 2020.04.20 දිනැති ලිපිය හා බැඳේ.

02. ඉහත ලිපිය අනුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණිය හා 2 පන්තිය II ශ්‍රේණිය සහ සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නවක නිලධාරීන් සඳහා රාජකාරි භාර ගැනීමේ දිනය 2020.05.04 දක්වා දීර්ඝ කරන ලදී.

03. නමුත් ඇතැම් දිස්ත්‍රික්කවල අඛණ්ඩව ක්‍රියාත්මක වන ඇඳිරි නීතිය සහ දිස්ත්‍රික්ක හරහා සංචරණය සඳහා ඇති බාධා ඇතුළුව දැනට උද්ගතව ඇති තත්ත්වය අනුව බොහෝ නිලධාරීන්ට එම දිනය වන විට රාජකාරි භාර ගැනීමේ අසීරුතාවයක් පවතින නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් නවක පත්වීම්ලාභී නිලධාරීන්ට සේවා ස්ථානවල රාජකාරි නොපමාව භාර ගැනීමට අවශ්‍ය ඉඩකඩ සලසා දීම ද අවශ්‍යව ඇත.

04. ඒ අනුව කාර්යාල පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් රජය විසින් නිකුත් කර ඇති විධිවිධාන කෙරෙහි ද සැලකිල්ල යොමු කර නවක නිලධාරීන් නොපමාව සේවා ස්ථානවලට කැඳවිය යුතු ආකාරය පිළිබඳව උපදෙස් මවිසින් අදාළ ආයතන ප්‍රධානීන් වෙත කඩිනමින් නිකුත් කරන බව සැලකුව මැනවි.

04. එබැවින් එම උපදෙස් නිකුත් කරන තෙක් ඒ සම්බන්ධයෙන් සාවධානව සිටින ලෙස ද කාරුණිකව දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

இணைந்த சேவைகள் பிரிவு
சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.

COMBINED SERVICES DIVISION
*Independence Square, Colombo 07, Sri Lanka*

දුරකථනය / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணைத்தளம்: **www.pubad.gov.lk** / Web Site

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | R/DO/PER.APP/2020 | |
| ඔබේ අංකය / உமது இல / Your No | | |
| දිනය / திகதி / Date | 2020.05. 04 | |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**2018.08.20 වන දින උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගත් රැකියා විරහිත උපාධිධාරීන් සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියට පත් කිරීම සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණිය සහ 2 පන්තිය II ශ්‍රේණියට පත් කිරීම**

උක්ත පත් කිරීම්වලට අදාළ පත්වීම් ලිපි 2020 පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් මාසවල නිකුත් කරන ලද නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පත්වීම්ලාභී නිලධාරීන් බොහෝමයකට මෙතෙක් වැඩ භාර ගැනීමට නොහැකිව ඇත. එය නිලධාරීන්ගේ පාලනයෙන් බැහැර කරුණක් වන බැවින් මා විසින් වරින් වර පත්වීම් භාර ගැනීම සඳහා වන කාලය දීර්ඝ කිරීමට කටයුතු සලසන ලදී. එහෙත් ඉහත සංවර්ධන නිලධාරීන්ගේ පත්වීම ක්‍රියාත්මක වන දිනය 2020.01.01 දින වන බැවින් ද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ පත්වීම් දිනය 2020.03.16 දින වන බැවින් ද එම නිලධාරීන්ට අප්‍රමාදව රාජකාරි සඳහා වාර්තා කිරීමට ඉඩ සලසා දිය යුතුව ඇත.

02. ඒ අනුව 2018.08.20 වන දින උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගෙන 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කරනු ලැබූ නිලධාරීන් අතුරින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020.02.27 සහ 2020.04.24 දිනැති පත්වීම් ලිපි/ සේවා ස්ථාන සංශෝධන ලිපි මගින් ඔබ ආයතනය වෙත අනුයුක්ත කරන ලද නිලධාරීන්ගේ තොරතුරු ද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නවක පත්වීම්ලාභීන්ගේ තොරතුරු ද ඔබ ආයතන වෙත කඩිනමින් යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

02. එම නිලධාරීන්ට රාජකාරි භාර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. නිලධාරීන් කැඳවීමේ දී සහ වැඩ භාර දීමේ දී කොවිඩ් 19 වෛරසය පවත්නා කාලය තුළ රජයේ නිලධාරීන් සේවයට වාර්තා කිරීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්ගේ අංක PS/GPA/චක්‍රලේඛ/20/2020 හා 2020.04.18 දිනැති ලිපියේ විධිවිධාන සහ ඊට අදාළව විටින් විට නිකුත් කරනු ලබන දැනුවත් කිරීම් අනුගමනය කරමින් කටයුතු කරන ලෙස ද එහි දී පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

i නිලධාරීන්ගේ පෞද්ගලික දුරකථන අංක ඔබ වෙත යොමු කර ඇති බැවින් සුදුසු පරිදි නිලධාරීන් කැඳවීමට ඔබට පහසුව සැලසෙන බව ද සැලකුව මැනවි.

ii සියලු නිලධාරීන් එකවර කැඳවීමකින් තොරව කණ්ඩායම් කිහිපයකට කැඳවා රාජකාරි භාර දීම සුදුසු වේ.

iii ප්‍රාදේශීය කාර්යාල නොමැති අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට අනුයුක්ත කරන ලද නිලධාරීන්ට කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලවල රාජකාරි කිරීමට සිදුවන අතර පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටත දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කරන ලද නිලධාරීන් ද තමා පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටතට පැමිණීමට සිදු වේ.

උදා:- යාපනය දිස්ත්‍රික්කයේ සිට අනුරාධපුර/පුත්තලම දිස්ත්‍රික්ක සඳහා අනුයුක්ත කරන ලද නිලධාරීන්

2

මෙම අවස්ථාවේ දිස්ත්‍රික්ක අතර ගමනාගමනය සම්බන්ධයෙන් වන සීමා කිරීම් ද, නවාතැන් සපයා ගැනීම සම්බන්ධ ගැටලු ද සැලකිල්ලට ගෙන පහත පරිදි සුදුසු ක්‍රමයක් අනුගමනය කිරීම යෝග්‍ය වේ.

a. ඇඳිරි නීති විධිවිධාන ලිහිල් කර ඇති දිස්ත්‍රික්කවල නිලධාරීන් වරින් වර කැඳවා ගෙන රාජකාරි භාර දී නැවත පිටත් කර හැරීම

b. ප්‍රාදේශීය කාර්යාල පවතින අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කළ නිලධාරීන් ආසන්නතම ප්‍රාදේශීය කාර්යාලය වෙත කැඳවා රාජකාරි භාර ගැනීමට ඉඩ සලසා දීම. (කොවිඩ් 19 වසංගත තත්ත්වය පහව ගොස් සංචරණ සීමාවන් සම්පූර්ණයෙන් ලිහිල් වූ පසු නැවත පුරප්පාඩු සහිත සේවා ස්ථානවලට අනුයුක්ත කිරීමේ කොන්දේසිය මත) එසේම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කරන ලද නිලධාරීන් පුරප්පාඩු පවතින දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කිරීමට එම ආයතන ප්‍රධානීන් අදහස් කරන්නේ නම් එම නිලධාරීන් සම්බන්ධයෙන් ද මේ අයුරින්ම කටයුතු කළ හැකිය.

c. සංචරණ සීමාකිරීම් හේතුවෙන් නිලධාරීන් ගෙන්වා රාජකාරි භාර දීම කිසිදු අයුරකින් සිදු කළ නොහැකි නම් රාජකාරි භාර ගැනීමට අදළ ලේඛන (රා.සේ.කො. සභා කාර්ය පටිපාටික රීතින්හි 3 සහ 4 පරිශිෂ්ඨ) නිසි පරිදි සකස් කර (ඇමුණුම) සම්පූර්ණ කිරීමෙන් පසු අදළ අනෙකුත් ලේඛන ද සමග (පත්වීම් ලිපිය, ජාතික හැඳුනුම්පත වැනි) සුදුසු සන්නිවේදන මාධ්‍යයක් මගින් (E-mail, Whats App, Viber, ..) ආයතන ප්‍රධානීන් වෙත ගෙන්වාගෙන අවශ්‍ය කටයුතු සිදු කිරීම.

03. <u>නිලධාරීන්ට වැටුප් ගෙවීම</u>

a. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ 2020.01.17 දිනැති ලිපිය මගින් මා වෙත යොමු කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝගය අනුව මෙම නිලධාරීන්ගේ පත්වීම් 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන බැවින් ඉහත පරිදි රාජකාරි භාර ගැනීමට ඉඩ සැලැස්වීමෙන් පසු මෙම නිලධාරීන්ට අදළ පරිදි වැටුප් සකස් කර ගෙවීමේ කටයුතු ද සිදු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

b. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණිය සහ 2 පන්තිය II ශ්‍රේණිය සඳහා නිලධාරීන් පත් කර ඇත්තේ 2020.03.16 දින සිට වේ. එම නිලධාරීන් වැඩ භාර ගැනීමෙන් පසු වැඩ භාර ගත් දිනය පදනම් කර ගෙන වැටුප් ගෙවීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින අතර එම නිලධාරීන්ගේ පත්වීම ක්‍රියාත්මක වන දිනය සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා ඉදිරියේ දී ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

04. <u>නවක පත්වීම්ලාභී සංවර්ධන නිලධාරීන්ගේ සේවා ස්ථාන සංශෝධන අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම</u>

මා වෙත වාර්තා වී ඇති පරිදි උතුර නැගෙනහිර සහ දකුණු පලාත්වලට අයත් දිස්ත්‍රික්කවල ද කුරුණෑගල සහ කෑගල්ල ඇතුළු දිස්ත්‍රික්ක කිහිපයක ද සංවර්ධන නිලධාරි සේවයේ පුරප්පාඩු තවදුරටත් නොපවතී. එබැවින් එම ප්‍රදේශවල සිට වෙනත් පුරප්පාඩු සහිත දිස්ත්‍රික්ක වලට අනුයුක්ත කර ඇති නිලධාරීන් එම අනුයුක්ත කර ඇති සේවා ස්ථානවල රාජකාරි භාර ගැනීමට කටයුතු කළ යුතු වේ.

එබැවින් **2020.05.15** දින වන විට නිලධාරීන්ට වැඩ භාර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා එදින වන විට ඔබ ආයතනවල සංවර්ධන නිලධාරි සේවයේ පවතින පුරප්පාඩු ප්‍රමාණය නිවැරදිව ෆැක්ස් මගින් (011-2692254, 011-2688754, 011-2681237) මා වෙත යොමු කළ යුතු වන අතර මෙතෙක් සලකා බැලිය නොහැකිව පවතින සේවා ස්ථාන සංශෝධන අභියාචනා සම්බන්ධව කටයුතු කළ හැකි වන්නේ එම පුරප්පාඩු සලකා පමණි.

05. 2018.08.20 වන දින උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවාගෙන වසරක පුහුණුව ලැබූ නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට පත් කිරීම සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ දෙවන වටයේ බඳවා ගැනීමේ කටයුතු මැතිවරණ කොමිෂන් සභාවේ අංක PF20/761/0309/4/A හා 2020.03.10 දිනැති ලිපිය මගින් ලද අනුමැතියට අනුකූල බව ද සැලකුව මැනවි.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## APPENDIX 03

(Registered Post)

Your No:

Name:..........................................................

Address…………………………………………………

……………………………………………………

Date: ...............................................................

………………………………………………..

………………………………………………..

………………………………………………..

Sir,

**Appointment to the Post of ...............................................................**

This refers to your letter No……………………….. dated …………………………………

02. I hereby inform you that agree to except the appointment in the public service offered to me by the letter under reference subject to the conditions mentioned therein.

02. I hereby inform you that I do not wish to except the appointment in the public service offered and letter of appointment is returned herewith.

Yours faithfully,

Signature: ......................................

## APPENDIX 04

(To be submitted in duplicate)

Address:..........................................................

..........................................................

..........................................................

Date: ..................................

To: Director General of Combined Services

Through: ..........................................................

Sir,

**<u>Reporting for Duty in the Post of .......................................... ................................</u>**

Reference letter No. ............................ dated ................. issued by secretary, Public Service Commission appointing me to the post mentioned above.

02. I hereby confirm that I reported for duty to ............................ on ..................... to discharge the relevant duties and responsibilities subject to the conditions mentioned in the letter under reference.

Yours faithfully,

Signature: .......................................

Name : ......................................

Designation : ..................................

---

(Appointing Authority)

I hereby certify that (Mr./Mrs./Miss) ........................................................................................

reported for duty in the post of ..........................................................................

on ..................................

Signature: ..................................

Name : ......................................

Designation : .............................

Date : ...........................

Official Stamp : ...........................